ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය

# සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගම

## සෙවනගල ඒකකය

# පුරප්පාඩු

මොණරාගල දිස්ත්‍රික්කයේ සෙවනගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ (ඇඹිලිපිටිය නගර ආසන්නයේ) පිහිටි සී/ස ලංකා සීනි පුද්ගලික සමාගමෙහි පවතින පුරප්පාඩු සඳහා පහත දැක්වෙන සුදුසුකම් සහ පළපුරුද්දක් සහිත කාර්යශූර ශ්‍රී ලාංකිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 1. සාමාන්‍යාධිකාරී - පුරප්පාඩු 01

**සුදුසුකම් සහ පළපුරුද්ද-**

- ආර්ථික විද්‍යාව, ගණකාධිකරණය, කළමනාකරණය, වාණිජ්‍ය, ගණිතය, කෘෂිකර්ම යන විෂයයන්ගෙන් එක් විෂයයක් හෝ විෂයයන් කිහිපයක් සහිත ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් හෝ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාලයකින් ලබාගත් ඉංජිනේරු උපාධියක්

සමඟ

- ව්‍යාපාර පරිපාලනය/කළමනාකරණය සඳහා වූ පශ්චාත් උපාධියක් සමඟ රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමේ" තනතුරක අවම වශයෙන් වසර 20ක පළපුරුද්දක් ලබා තිබීම.

## 02. ප්‍රධාන අභ්‍යන්තර විගණක - පුරප්පාඩු 01

**සුදුසුකම් සහ පළපුරුද්ද -**

- ගණකාධිකරණය ප්‍රධාන විෂයයක් වශයෙන් ඇතුළත් කළමනාකරණය හෝ වාණිජ්‍ය විෂය පිළිබඳ වූ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක්

සහ

උපාධිය ලබා ගැනීමෙන් පසු විගණන ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර අටක (08) පළපුරුද්දක් තිබීම හා ඉන්වසර 05 ක් විධායක ශ්‍රේණියේ වීම.

හෝ

- පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ගණකාධිකරණය පිළිබඳ අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත්වීම සහ සුදුසුකම් ලබාගැනීමෙන් පසු ගිණුම් ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර අටක (08) පළපුරුද්දක් තිබීම හා ඉන් වසර 05 ක් විධායක ශ්‍රේණියේ වීම.

## 03. රසායන ඉංජිනේරු - පුරප්පාඩු 05

**සුදුසුකම් සහ පළපුරුද්ද**

- ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගත් ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයක් මගින් පිරිනමන ලද සිව් අවුරුදු පූර්ණ කාලීන රසායන ඉංජිනේරු විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම සහ ආශ්‍රිත සාමාජිකත්වය දැරීම ( AMIE - IESL)

සමග

- අදාල ඉංජිනේරු ක්ෂේත්‍රය සඳහා ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් නිර්දේශිත විනය පරීක්ෂණය සහ විභාගයන් සම්පූර්ණ කර සමත්ව තිබීම හා ආශ්‍රිත සාමාජිකත්වය දැරීම

හෝ

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් පිරිනමන ලද රසායන ඉංජිනේරු විද්‍යාවේදී උපාධියට සමාන වූ ද ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය ආශ්‍රිත සාමාජිකත්වය (Associate Member ship) සඳහා සුදුසුකම් සපුරාලන උපාධියක් සමත්ව තිබීම.

## 04. යාන්ත්‍රික ඉංජිනේරු - පුරප්පාඩු 02

**සුදුසුකම් සහ පළපුරුද්ද**

- ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගත් ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයක් මගින් පිරිනමන ලද සිව් අවුරුදු පූර්ණ කාලීන යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම සහ ආශ්‍රිත සාමාජිකත්වය දැරීම (AMIE - IESL)

සමග

- අදාල ඉංජිනේරු ක්ෂේත්‍රය සඳහා ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් නිර්දේශිත විනය පරීක්ෂණය සහ විභාගයන් සම්පූර්ණ කර සමත්ව තිබීම හා ආශ්‍රිත සාමාජිකත්වය දැරීම

හෝ

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් පිරිනමන ලද යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාවේදී උපාධියට සමාන වූ ද ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය ආශ්‍රිත සාමාජිකත්වය (Associate Membership) සඳහා සුදුසුකම් සපුරාලන උපාධියක් සමත්ව තිබීම.

## 05. කෘෂිකර්ම නිලධාරී - පුරප්පාඩු 01

**සුදුසුකම් සහ පළපුරුද්ද**

- කෘෂි විද්‍යාව / කෘෂිකර්මය ප්‍රධාන විෂයයක් ලෙස ඇතුළත් ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් සමග අදාල ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්දක් ලබා තිබීම.

## 06. කෘෂිකර්ම සහායක - පුරප්පාඩු 02

**සුදුසුකම් සහ පළපුරුද්ද**

- පිළිගත් කෘෂිකර්ම විද්‍යාලයකින් ලබාගත් කෘෂිකර්මය පිළිබඳ දෑ අවුරුදු/තුන් අවුරුදු (පූර්ණ කාලීන ) ඩිප්ලෝමාවක් (NVQ 5/6) සමග කෘෂිකර්ම ක්ෂේත්‍රයේ වසර දෙකක පළපුරුද්දක් ලබා තිබීම.

ඉහත සුදුසුකම් වලට අමතරව සියලුම අයදුම්කරුවන් පහත සුදුසුකම් සම්පූර්ණ කළ යුතුය

- සාමාන්‍යාධිකාරී තනතුර සඳහා වයස අවුරුදු 35 ට නොඅඩු 55 නොවැඩි විය යුතුය.
- අනෙකුත් තනතුරු සඳහා අවුරුදු 22 ට නොඅඩු 45 ට නොවැඩි විය යුතුය.
- ශ්‍රී ලාංකීය පුරවැසියෙකු විය යුතුය.
- තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම අධ්‍යක්ෂ මණ්ඩලය නියම කරන ස්ථානයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
- විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

ඉහත සඳහන් තනතුරු ආකර්ෂණීය දීමනා වලින් සමන්විත වන අතර නවාතැන් පහසුකම් මෙන්ම අනෙකුත් සුභසාධන පහසුකම් වලින් ද යුක්ත වේ.තෝරාගනු ලබන පුද්ගලයින් දෛනික සේවා කාලයට අමතරව මෙන්ම අත්‍යාවශ්‍ය අවස්ථා වලදී සති අන්ත රාජකාරීන් වලද නිරත විය යුතු අතර,අවම නිවාඩු ලබා ගත යුතුය.

අයදුම්කරුවන්, තමා පිළිබඳව විස්තර දැන ගත හැකි ඥාතීන් නොවන පුද්ගලයින් දෙදෙනෙකුගේ නම, ලිපිනය සහ දුරකතන අංක සහිතව ලබා දී ඇති ආකෘති අයදුම් පත්‍රය පුරවා මෙම දැන්වීම පළකළ දින සිට දින 14 ක් ඇතුළත පහත සඳහන් ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑල මගින් එවිය යුතුය.නියමිත සුදුසුකම් සපුරා නොමැති මෙන්ම නියමිත දිනට පසුව එවන ලද අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.(අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.)

**සභාපති**
**සී/ස ලංකා සීනි (පුද්) සමාගම**
**අංක 27, මෙල්බර්න් ඇවනියු, කොළඹ 04,**
**ශ්‍රී ලංකාව**

SELACINE

25/03/2024 | Dinamina | Page : 22
Source : https://epaper.dinamina.lk/